අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறிப்பு / My Ref. PTF/02/Circular./01
ඔබේ යොමුව / உமது குறிப்பு / Your Ref.
දිනය / திகதி / Date 2020.03.30

චක්‍රලේඛ අංක - PTF/02

**පොලිස්පති**

**ආහාර, ඖෂධ ඇතුළු අත්‍යවශ්‍ය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ඇඳිරි නීති බලපත්‍ර කඩිනමින් නිකුත් කිරීම**

ශ්‍රී ලංකාවෙන් නව කොරෝනා වෛරසය තුරන් කිරීම සඳහා රජය විසින් ගෙන යන ජාතික වැඩපිළිවෙළට සමගාමීව සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන සේවාවන් අඛණ්ඩව සැපයීම අත්‍යවශ්‍ය වන අතර, ඒ සඳහා පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් මහජනතාවගේ දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කිරීම ප්‍රමුඛ වගකීමක් වේ.

02. එහෙත්, මහජනතාව වෙත ආහාර, ඖෂධ හා ගෑස් වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ දී , සේවාවන් සැපයීමේ දී ගමන් කිරීමට අවශ්‍ය ඇඳිරිනීති බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව ගැටලු පැන නැගී ඇති බව වාර්තා වී ඇත. එහෙයින්, මතු දක්වා ඇති ක්ෂේත්‍රයන් හි සේවාවන් අඛණ්ඩව සැපයීම තහවුරු කිරීම උදෙසා ඇඳිරිනීති බලපත්‍ර ලබාදීමේ වැඩපිළිවෙළ කඩිනම් කිරීම අවශ්‍ය වේ.

03. ඒ අනුව, පහත දක්වා ඇති ක්ෂේත්‍රයන්ට අයත් අත්‍යවශ්‍ය සේවාවන් සඳහා ඇඳිරි නීති බලපත්‍ර පහත සඳහන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ මත නිකුත් කිරීමට අදාළ පොලිස් ස්ථාන වෙත උපදෙස් ලබා දෙන ලෙසත්, හැකි සෑම විටම නිර්දේශ ලබාදෙන ආයතනය වෙත ගොස් ඇඳිරිනීති බලපත්‍ර නිකුත් කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමට පියවර ගන්නා ලෙසත් ඉල්ලා සිටිමි.

| අංකය | සේවා කාණ්ඩය | නිර්දේශය |
|---|---|---|
| 01. | විදුලිය සැපයීම<br><br>**(ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි පුද්ගලික සමාගම)** | දිස්ත්‍රික්කය ඒකකයක් ලෙස සලකා දිස්ත්‍රික්කය තුළ අත්‍යවශ්‍ය නඩත්තු, සේවා හා අඛණ්ඩ විදුලිය සැපයීම සඳහා අත්‍යවශ්‍ය වන අවම කාර්ය මණ්ඩලය, සාමාන්‍යාධිකාරී/දිස්ත්‍රික් විදුලි ඉංජිනේරුගේ ඉල්ලීම අනුව දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 02. | ජල සැපයුම<br><br>**(ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය)** | දිස්ත්‍රික්කය ඒකකයක් ලෙස සලකා දිස්ත්‍රික්කය තුළ අත්‍යවශ්‍ය නඩත්තු, සේවා හා අඛණ්ඩ ජල සැපයුම ලබාදීම සඳහා අත්‍යවශ්‍ය වන අවම කාර්ය මණ්ඩලය,සාමාන්‍යාධිකාරී/දිස්ත්‍රික් කළමණාකරුගේ ඉල්ලීම අනුව දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |



කාර්යාලය / அலுவலகம் / Gen. Office 2575317 2575318
ෆැක්ස් / பெக்ஸ் / Fax 2574143 2575454 2575310
විද්‍යුත් තැපැල / ஈ மெயில் / E-mail secpm@pmoffice.gov.lk

| | | |
|---|---|---|
| 03. | ඉන්ධන හා ලිහිසි තෙල් බෙදාහැරීම සහ ප්‍රවාහනය<br><br>**(ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව/ලංකා ඛනිජතෙල් ගබඩා කිරීමේ පර්යන්ත සමාගම/ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම)** | දිස්ත්‍රික්කය ඒකකයක් ලෙස සලකා දිස්ත්‍රික්කය තුළ අවශ්‍ය ඉන්ධන ප්‍රවාහනය හා බෙදාහැරීමට අත්‍යවශ්‍ය වන අවම කාර්ය මණ්ඩලය ප්‍රාදේශීය කළමණාකරු / බෙදීම් කළමණාකරුගේ ඉල්ලීම අනුව, දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 04. | ගෑස් බෙදාහැරීම සහ ප්‍රවාහනය<br><br>**(ලිට්රෝ සමාගම/ලාෆ් ගෑස් පුද්ගලික සමාගම)** | අදාළ සමාගමේ සාමාන්‍යාධිකාරි හෝ බලයලත් නිලධාරියකුගේ ඉල්ලීම අනුව දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 05. | ධීවර රැකියාවේ නිරතවීම හා ධීවර කටයුතුවලට අදාළ පහසුකම් සපයන ආයතන හා ධීවර තොග වෙළඳ ආයතන<br><br>**(සිල්ලර මිලදී ගැනීම සඳහා බලපත්‍ර ලබා දීම් නොකළ යුතුය)** | ධීවර අධ්‍යක්ෂ ජනරාල්/දිස්ත්‍රික් ධීවර සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 06. | වරාය හා නාවික සේවා කටයුතු සහ ගුවන් සේවා කටයුතු<br><br>**(ශ්‍රී ලංකා වරාය අධිකාරිය/ ශ්‍රී ලංකා ගුවන්තොටුපළ හා ගුවන් සේවා සමාගම)** | අත්‍යවශ්‍ය අවම කාර්ය මණ්ඩලය පවත්වා ගනිමින් අදාළ සමාගමේ සාමාන්‍යාධිකාරි හෝ බලයලත් නිලධාරියකුගේ නිර්දේශය |
| 07. | සත්ත්ව ආහාර සහ සත්ත්ව ඖෂධ සැපයීම | අධ්‍යක්ෂ ජනරාල් - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව/ප්‍රාදේශීය පශු වෛද්‍ය නිලධාරී හෝ දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 08. | ඖෂධ තොග වශයෙන් බෙදාහැරීම, ගබඩා කිරීම සහ ඖෂධ නිවෙස් වලට බෙදාහැරීම (අනුමත රජයේ ඔසුසල්, ෆාමසි, ඖෂධ බෙදාහැරීමේ සමාගම් හා බලයලත් නියෝජිත සමාගම් සඳහා)<br><br>නව කොරෝනා තත්ත්වයන්ට ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය උපකරණ නිෂ්පාදන හා ඊට අදාළ පර්යේෂණ කටයුතු කරන ආයතන | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/ඖෂධ නියාමන අධිකාරියේ සභාපති/ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී /සාමාන්‍යාධිකාරි හෝ ඖෂධ නීතිගත සංස්ථාවේ බලයලත් නිලධාරියෙකු සහ අදාළ ආයතනය පිහිටි ප්‍රදේශයේ දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |

| | | |
|---|---|---|
| 09. | කසළ කළමනාකරණය, ආදාහනාගාර සේවා, ගිනි නිවන සේවා ඇතුලු පළාත් පාලන ආයතන විසින් පවත්වාගෙන යනු ලබන අත්‍යවශ්‍ය සේවාවන් | පළාත් පාලන ආයතනයන් හි නාගරික කොමසාරිස්/ ලේකම්ගේ නිර්දේශය හෝ දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 10. | බැංකු, අත්‍යවශ්‍ය වාණිජ හා ආනයන හා අපනයන කටයුතු වලට අදාළ රක්ෂණ කටයුතු, තැපැල් හා විදුලි සංදේශන, පුද්ගලික ආරක්ෂක සේවා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා ඇතුලු අත්‍යවශ්‍ය සේවා සපයන රාජ්‍ය ආයතනයන් හි සේවකයින් | අත්‍යවශ්‍ය අවම කාර්ය මණ්ඩලය සඳහා අදාළ ආයතන ප්‍රධානියාගේ ඉල්ලීම අනුව දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 11. | ජනමාධ්‍ය ආයතන | අදාළ ආයතනවල සේවක හැඳුනුම්පත ප්‍රමාණවත් වේ. |
| 12. | විවිධ සේවා සමුපකාර සමිති, සමුපකාර තොග වෙළඳ සංස්ථාව වෙත භාණ්ඩ ප්‍රවාහනය | සමූපකාර කොමසාරිස් හෝ සහකාර සමූපකාර කොමසාරිස් / දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 13. | අත්‍යවශ්‍ය භාණ්ඩ ගෙන්වා බෙදාහරින ආයතන, පෞද්ගලික සිල්ලර වෙළඳසැල්, ග්‍රොසරි හා බිත්තර, මස්, කිරි, මාලු ඇතුළු සත්ත්ව නිෂ්පාදන | අදාළ ආයතනවල ලිඛිත ඉල්ලීම මත දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 14. | ආහාර, ඖෂධ ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනය සඳහා කුරියර් සර්විස් පවත්වා ගෙනයාම<br>සුපිරි වෙළෙඳසැල් ජාලය හරහා "Online" ක්‍රමය මඟින් භාණ්ඩ ප්‍රවාහනය<br>ක්ෂණික ආහාර නිවෙස් වලට බෙදා හැරීම සිදු කරන ආයතන<br>ආර්ථික මධ්‍යස්ථාන වෙත තොග වශයෙන් භාණ්ඩ ප්‍රවාහනය | අදාළ ආයතනවල බලයලත් නිලධාරියෙකුගේ ඉල්ලීම මත හෝ අදාළ පුද්ගලයන්ගේ ඉල්ලීම මත දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |

| | | |
|---|---|---|
| 15. | කොළඹ තේ වෙන්දේසියට සහභාගීවන තේ කර්මාන්තශාලා හිමියන් හා තේ විකුණුම්කරුවන් සඳහා | දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 16. | තේ ගැනුම්කරුවන් සහ තේ බ්‍රෝකර්වරුන් සඳහා | තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමයේ සභාපතිගේ ඉල්ලීම අනුව දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 17. | ජංගම බැංකු පහසුකම් (නිවාස අසලට ගොස් ATM යන්ත්‍ර හරහා මුදල් ලබා ගැනීමේ පහසුකම් සැලසීම සඳහා පමණි) | අදාළ බැංකුවේ සාමාන්‍යාධිකාරී/අදාළ බැංකු ශාඛාවේ කළමණාකරුගේ ඉල්ලීම අනුව දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 18. | වී,එළවළු, පළතුරු,තේ, රබර්, පොල්, සුළු අපනයන භෝග, ගොවිපළ, පැළ තවාන් ආදී කෘෂිකාර්මික කටයුතු සිදු කරන සහ ඒ ආශ්‍රිත බීජ, පැළ, පොහොර, රසායනික ද්‍රව්‍ය ආදිය නිෂ්පාදනය කරන / බෙදාහරින ආයතන සහ සේවා සපයන්නන් | කෘෂිකර්ම උපදේශක විසින් හඳුනා ගන්නා ලද අවම කාර්ය මණ්ඩලයක් සඳහා දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 19. | රතුකුරුස සංවිධානය හා ශාන්ත ජෝන් ගිලන්රථ සේවය සඳහා | මෙම සේවාවන් පවත්වා ගෙනයාම සඳහා එක්වරක දී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය |
| 20. | අවස්ථානුකූලව ඇති වන වෙනත් අත්‍යාවශ්‍ය සේවා - ආපදා, හදිසි තත්ත්වයන් සඳහා සහභාගි වන තැනැත්තන් සඳහා | දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 21. | ආනයන හා අපනයන කාර්යයන් හි යෙදී සිටින නැව් හා ගුවන් ඒජන්තවරුන් සහ එම නිශ්කාශන කටයුතුවල යෙදී සිටින සමාගම්වල සේවකයින් | එම සමාගම්වල ඉල්ලීම මත හඳුනා ගන්නා ලද අවම කාර්ය මණ්ඩලයක් සඳහා දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය |
| 22. | බලපත්‍රලාභී මුදල් තැරැව්කාර ආයතන, ලංකා ක්ලියර් ආයතනය හා අනෙකුත් අත්‍යාවශ්‍ය රාජකාරීවල යෙදෙන මහ බැංකු දෙපාර්තමේන්තුවල නිලධාරීන් | ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හෝ සහකාර අධිපතිගේ නිර්දේශය |

04. ග්‍රාමීය කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන ගොවීන් හා තේ, පොල්, රබර්, කුරුඳු, උක් වැනි අනෙකුත් සුළු අපනයන භෝග වගා කටයුතුවල යෙදෙන්නන් හා කෘෂිකාර්මික වාහන සඳහා ඇඳිරිනීති බලපත්‍ර අවශ්‍ය නොවේ. කෘෂිකාර්මික කටයුතුවලට යොදන සීමිත භූමි ප්‍රදේශයක් තුළ පමණක් මෙය බලපැවැත්වේ.

05. පොලිස් සේවය, ත්‍රිවිධ හමුදාවන්, සිවිල් ආරක්ෂක බලකාය හා සෞඛ්‍ය සේවයේ නිරතව සිටින සාමාජිකයින් සඳහා ඇඳිරි නීති බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය නොවන බව සැලකිය යුතුය. ඒ සඳහා ඔවුන්ගේ නිල හැඳුනුම්පත පෙන්වා සිටීම ප්‍රමාණවත් වේ.

06. මෙම උපදෙස් වලට අනුකූලව සියලු කටයුතු දින දෙකක් (02) තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. එසේම, සෑම අවස්ථාවකදී ම අත්‍යවශ්‍ය අවම කාර්ය මණ්ඩලයකට පමණක් සීමා වන සේ ඉහත නිර්දේශයන් ලබා දිය යුතුය. **තවද, මෙම සියලු නිර්දේශයන් ලබාදිය යුත්තේ සෞඛ්‍ය අංශ විසින් නිකුත් කර ඇති කාලීන උපදෙස්, නියාමයන් හා පිරිවිතරයන්ට අනුකූලවම විය යුතු අතර, එසේ වන බවට සියලු අංශ වගබලා ගත යුතු බව අවධාරණය කරමි.**

**ගාමිණී එස්. සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්
ප්‍රධාන මෙහෙයුම් නිලධාරි - අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම
මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය

**පිටපත්:**

01. ජනාධිපති ලේකම්
02. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
03. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
04. ලේකම්, මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
05. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

(01 - 05) කාරුණික දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා

06. ලේකම්, සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය - මෙම සියලු අනුමැතීන්ට අනුව කටයුතු කිරීමේ දී සෞඛ්‍ය නියමයන්ට අනුකූලව කටයුතු සිදු වන්නේ ද යන්න නිරන්තර අධීක්ෂණය සඳහා

07. සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
08. සියලුම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්
09. සියලුම ප්‍රධාන ලේකම්වරුන්
10. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි /යුද්ධ හමුදාපති
11. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
12. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
13. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

(07 - 13) කාරුණික දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා

14. සියලුම පළාත් පාලන කොමසාරිස්වරු
15. අදාළ ආයතන ප්‍රධානීන්